පහසු කරන්න අපහසු නොකරන්න, ශුභාරංචි දන්වන්න පලවා නොහරින්න

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අනස් ඉබ්නු මාලික්
(රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. "පහසු කරන්න අපහසු නොකරන්න, ශුභාරංචි දන්වන්න පලවා නොහරින්න." [صحيح] [متفق عليه]

ආගමික හා ලෞකික සියලුම කටයුතුවලදී මිනිසුන්ට අපහසුතා ඇති නොකර, ඔවුනට සහන සලසමින් හා පහසුව ගෙන දෙමින් කටයුතු කරන මෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ නියෝග කළහ. යහපත ගැන ඔවුනට ශුභාරංචි දැන්වීමටත් ඔවුන් එයින් නෙරපා නො හැරීමටත් එතුමාණෝ දිරි ගැන්වූහ.

http://sunnah.global/hadeeth/si/show/5866